# කැලණිය විශ්වවිද්‍යාලය - කැලණිය

## ශිෂ්‍ය/ශිෂ්‍යාවන්ට නේවාසික පහසුකම් සැලසීම සඳහා

## නිවාස/ගොඩනැගිලි බදු ගැනීම

කැලණිය විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට නේවාසික පහසුකම් සැලසීම සඳහා දළුගම විශ්වවිද්‍යාල පරිශ්‍රයේ සිට කිලෝමීටර් 05 ක් ඇතුළත පිහිටි, විද්‍යාර්ථීන් 50කට වැඩි පිරිසකට නේවාසික පහසුකම් සැලසිය හැකි නිවසක්/නිවාස කිහිපයක් කුලියට හෝ බද්දට ගැනීමට අපේක්ෂා කෙරේ. මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන නිවාස හිමියන් පහත සඳහන් තොරතුරු සමග සියලු විස්තර **2018.11.30** දිනට හෝ ඊට පෙර ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, ශිෂ්‍ය සේවා, කැලණිය විශ්වවිද්‍යාලය යන ලිපිනය වෙත ලැබෙන සේ එවන මෙන් ඉල්ලා සිටිනු ලැබේ. වැඩි විස්තර 0112- 903125 දුරකථන අංකය ඔස්සේ විමසිය හැකිය

1. කුලියට/බද්දට දෙන නිවසේ ලිපිනය
2. අයිතිකරු ඇමතිය හැකි දුරකතන අංක/අංකය
3. එම නිවසේ සිට විශ්වවිද්‍යාලයට ඇති දුර
   (විශ්වවිද්‍යාලයේ සිට පැමිණිය හැකි මාර්ගය දළ රූප සටහනක් මගින් දක්වන්න)
4. නේවාසික පහසුකම් සැලසිය හැකි ශිෂ්‍ය සංඛ්‍යාව
5. එම නිවස පිළිබඳ විස්තර
   - i නිවසේ ඇති කාමර සංඛ්‍යාව හා වර්ග ප්‍රමාණය
   - ii දැනට පවතින වැසිකිළි සංඛ්‍යාව හා නාන කාමර සංඛ්‍යාව
6. ජල පහසුකම් ලබාදිය හැකි අන්දම (ළිං/නල ජලය)
7. අප ජලය බැහැරවීම සිදුවන ආකාරය
8. ලබා දිය හැකි ආරක්ෂිත විධිවිධාන
9. සැපයිය හැකි වෙනත් පහසුකම්
10. අපේක්ෂිත මාසික කුලිය/බදු මුදල

ලේඛකාධිකාරී
කැලණිය විශ්වවිද්‍යාලය
2018.10.26